# කරුණාවතී ගුණවතී හා වයලට් නාලිනී



ජනසවිය උත්සාහයෙන්
අංක 2

BKT0149
26/08/2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# කරුණාවතී ගුණවතී හා වයලට් නාලනී



ප්‍රකාශනය: ජනසවිය කොමසාරිස් දෙපාර්තමේන්තුව

මග පෙන්වීම

සුසිල් සිරිවර්ධන

(ජනසවිය කොමසාරිස්)

චිත්‍ර

ජගත් රණතුංග

මුද්‍රණය:
තරුණ සේවා මුද්‍රණාලය
මහරගම.

# කරුණාවතීගේ කතාව



කරුණාවතිටත් ඇගේ ගම වූ නාම්ණිකුලමටත් 1990 ඔක්තෝම්බර් මස 2 වන දින ඉතා වැදගත් දිනයක් වූයේ එදින ජනසවිය වැඩපිළිවෙළේ ප්‍රථම සංවත්සරය යෙදී තිබුණු හෙයිනි. ජනසවිය කරුණාවතිගේ පවුලේත් ගමේ අනෙක් පවුල්වලත් පරිවර්තන යක් ඇති කළ වැඩ පිළිවෙළකි.. මූලික වශයෙන් එය ඔවුන්ගේ අභ්‍යන්තරයෙන්ම පැන නැගුණු පරිවර්තනයක් විය. එහි සම්බන්ධතාවය අතිශයින් තීරණාත්මක බව ඔවුනට වැටහිණ.

ජනසවිය ක්‍රියාත්මක වූ දිවයිනේ ගම් 2900 න් නාම්ණිකුළම ද එක් ගමක් විය. දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ගසු වන පරිදි ඒ ඒ දිස්ත්‍රික්කවල වූ ඉතා නොදියුණු උප දිසාපති කොට්ඨාශ 28 ක්, පළමු වටයට තෝරා ගනු ලැබීය. මෙහි දෙවන වටය 1990 දෙසැම්බර් මස 3 වන දින ඇරඹීමට නියමිතයි. මෙම වැඩ පිළිවෙළ වට 11 කින් යුක්ත වූවකි.

කරුණාවති සහ ඇගේ වැඩිමහල් දියණිය වූ ලතා එදින උදය ආහාරය ගෙන, ඔවුන්ගේ කුඩා නිවසේ පිළට වී වාඩි වී සිටිනු

දක්නට ලැබිණ. කිසිවක් නොදත් කුඩා එවුන් දෙදෙන පමණක් ඒ එන විටත් නින්දේ පසු වූහ. මව සහ දුව කල්පනා කළේ එද දවසේ වැදගත්කම ගැනයි. ඉන් පළමුවැන්න වූ කලී ජනසවිය කෙරෙහි ඔවුනුත් ඔවුන්ගේ සහෝදර ගැමියනුත් කොතරම් දුරට විශ්වාසය තබා සිටිත් ද යන්නයි. මහජන හොඳහිත හා විශ්වාසය අරගයා එහි මහ එළිපෙහෙළි කර තිබේ. නවදුරටත් කිසිවෙකුට කලකිරීමට හෝ යටත් වී සිටීමට සිදු නොවේ. දෙවැන්න වූ කලී ඔවුනුත් ඇගේ සහෝදර ගැමියනුත් ජනසවියෙන් කොපමණ දුරට ඉගෙන ගත්තේ ද යන්නයි. ජනතාව. ඔවුනුත් ස්වාභාවික සම්පතුත්. සැබවින්ම හඳුනාගනිමින් සිටිති. රට තුළ පැවති අර්බුද හා භීෂණ මධ්‍යයේ වුව මේ සියල්ල උදැවූ අන්දම ඇය මෙනෙහි කළාය.

භීෂණය හා ත්‍රස්තවාදය ගැන සඳහන් කරන විට 1989 අමතක නොවන වර්ෂයකි. භීෂණය නාම්ණිකුළමට ද දැනිණි. නාම්ණිකුලම වටා හැම ගමකම පැවතියේ ද එම තත්ත්වයයි. ජනසවියේ මුල් ජනහමුවීම් පැවැත් වූයේ මෙබඳු වාතාවරණයක් මධ්‍යයේ බව කිව යුතුය.

දුප්පතුන් ඒ ජන හමුවීම්වලට පැමිණියේ ජනසවිය ඔවුන්ගේ බියත් තුරන් කිරීමට සමත් වූවා මෙනි. මෙකී හමුවීම්වල දී තරුණ තරුණියන් දැක්වූ දැඩි උනන්දුව ගැන ද ඇයට සිහිපත් විය. එහි දී ඔවුහු ප්‍රශ්න පිට ප්‍රශ්න නැගූහ. එහෙත් ඒ සියල්ලටම උප දිසාපති තැන නොවලහා උත්තර සැපයුවේය. ජනසවිය ප්‍රතිපත්ති නැවත මතක් කරමින් කථා කළ ඔහු - ජනතාව විශ්වාස කරන්න - වෙසෙසින්ම දුප්පත් ජනතාව විශ්වාස කරන්න - තීරණ ගැනීමත් ඒවා ක්‍රියාත්මක කිරීමත් දුප්පත් ජනතාවට භාරය. - අනෙක් අයට කරන්නට ඇත්තේ ඔවුනට සහයවීමයි. - දුප්පත් ජනතාව සංවිධානය කළ යුතුයි. මෙය හුදෙක් වැඩ කිරීමෙන් ලබන අධ්‍යයනයකි. - මෙහි සැම වැඩපිළිවෙළක්ම විවෘතයි - කාට වුවද ඒවා විනිවිද දැකිය හැකිය - යන ප්‍රතිපත්ති මාලාව අවධාරණය කළේය. ජනසවිය වැඩපිළිවෙළ ගැන ඔවුන් තුළ පැවති අවිශ්වාසය හා සැක සහිත සිතුවිලි පහවූයේ ඉන් පසුවය.

අර අවාසනාවන්ත සිද්ධි සිදුවූයේ සැප්තැම්බර් අග දිය. ඔක්තෝම්බර් මස පටන් ගන්නට ඔන්න මෙන්න කියා තිබිය දිය. ගමේ තැපැල් කාර්යාලය ගිනිබත් විය. ත්‍රස්තවාදීන් එය ගිනි තැබීමට පෙර ජනසවිපත් පමණක් අයින් කරන්නට පෙළඹීම හුදෙක් ජනසවියේ හාස්කමක් උඩ සිදුවුනකැයි සිතිය හැකිය. විශේෂයෙන්ම පණිවුඩ හුවමාරුව, ප්‍රජාතන්ත්‍රවාදය හා ජනවිශ්වාසය විනාශ වෙමින් පැවති සමයක දි එම ජන සම්පත් නිරුපද්‍රිතව තිබීම හාස්කමක්ම විය යුතුය. සාධාරණත්වය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

උදෙසා කැපවුණු ජනසවියේ ජයග්‍රහණය නොවැළැක්විය හැකි බව මොනවට පෙනිණ.

ජනසවිය සහාය කණ්ඩායමට අයත් වූ පස් දෙනා ගෙන් තමාද එක් අයෙකු වූ අන්දම කරුණාවති සිහිපත් කළාය. පස් දෙනාගේ කණ්ඩායමෙන් සතර දෙනෙකු ගමෙන්ම තෝරා ගනු ලැබූ අතර, ඉන් එක් අයෙකු අනිවාර්යයෙන්ම කාන්තාවක් විය යුතුවිය. එහි පස්වැන්නා වූයේ ගමේ ග්‍රාම සේවා නිලධාරිතැනයි. මෙම තෝරාගැනීම් මුළුමනින් විශ්වාසය මතම - ගැමියන් විශ්වාසය තැබූ පුද්ගලයින්ගෙන්ම - තෝරා ගන්නා ලදි. එතුවල ජනසවි කටයුතු සඳහාත් මෙවැනි කණ්ඩායම් පත් වූ බව ඇයට අසන්නට ලැබී තිබේ.

සහාය කණ්ඩායමේ මූලික කාර්‍ය්‍ය වූයේ ගැමියන් අතුරින් අත්‍යන්තයෙන්ම දුප්පත් කවුරුන්ද යන්න තෝරා බේරා ගැනීමයි. ගෙයින් ගෙට යමින් ගැමියන් හමුවෙමින් හා ලැයිස්තු සකස් කරමින්, සහාය කණ්ඩායම එම දුෂ්කර කාර්‍ය්‍ය මැනවින් ඉටු කළේය. තෝරා ගැනීම්වල දී සමහර පවුල් සිය කැමැත්තෙන්ම ඉවත් වී සිටියහ. මෙහිලා පිටතින් කිසිදු අන්දමක බලපෑමක් නොවීය. දේශපාලන හෝ නිලධාරි ඇඟිලි ගැසීම් ද නොවීය. එකල පැවැති වාතාවරණය බිහිසුණු වුව ද ජනසවිය වැඩපිළිවෙල මෙසේ නොනවත්වාම ක්‍රියාත්මක විය.

ජනසවියට පෙර නාමිණිකුළමෙහි ආහාර මුද්දර ලබන පවුල් 55 සිටිය ද, ජනසවිය ආරම්භ වී අවුරුද්දකට පසු එම පවුල් ගණන 20 දක්වා අඩු විය. එහෙත් අලුතින් දුප්පත් පවුල් 6 ක් ඊට ඇතුළත් වුණු නිසා මුළු ගණන 26 ක් විය. මේ අතර, මුළු දිවයිනේම වූ දුප්පත් පවුල් 224000 ක් ජනසවි සමීක්ෂණයෙන් පසු 159000 ක් දක්වා අඩු වූ අයුරු ඇයට ගුවන් විදුලියෙන් අසන්නට ලැබිණ. දුප්පතුන් තෝරා ගැනීමෙහිලා ජනතා සහභාගිත්වය අතිශයින් වැදගත් විය.

ජනසවියේ හරය වූකලී නිෂ්පාදනය උදෙසා එහි ඇති සම්බන්ධතාවයයි. දුප්පත් ජනතාව නිෂ්පාදනය වෙත යොමු කරන්නේ කෙසේ ද? ජනතාව දුප්පත්ව සිටින්නේ ඔවුන් උපදවන සුළු නිෂ්පාදන ප්‍රවාහනය කිරීමේ පහසුකම් නැති නිසාත්, හෝ ඔවුන්ගේ නිෂ්පාදන ගසා කෑමකට හසු වී තිබෙන නිසා විය යුතුය. සාරගම් වැඩපිළිවෙළ ඇරඹුනේ මීට ප්‍රතිකර්මයක් වශයෙනි. සාරගම් නිතිරීති අනුව ආධාර ලබන එක් එක් පවුල් ඔවුන්ගේ සුභසිද්ධිය සඳහා මසකට දින 20 ක් වැඩ කළ යුතුවිය. මෙහිදී නාමිණිකුළම දුප්පත් ජනතාව එකතු වී සතියකට දවස් 4 ක් ඔවුන්ගේම වැඩවලත්, එක් දවසක් පොදු වැඩවලත්, නිරත වීමට තීරණය කර ගත්හ.

පසුගිය යල සහ මහ කන්නවල දී වෙනස්කම් රාශියක් දක්නට ලැබිණ. සාරගම් වැඩපිළිවෙළ තුළින් යම් ප්‍රමාණයක එක්සත්කමක් හා ආරක්ෂිත බවක් උදාවූ සැටි ගැමියන් සිහිපත් කළේ මදක් පුදුමයෙනි. ඔවුහු එකතු වී මහ සෘතුවේ දී අවුරුදු 6 ක් තිස්සේ පුරන් වී තිබුණු අක්කර 6½ ක බිම් ප්‍රමාණයක මිරිස් වගා කළහ. කලට වේලාවට වැසි ද ලැබිණ. දැන් ඔවුහු උදේ 4 ට හෝ 5 පමණ අවදි වී වතුපිටිවලට යති.

කොතරම් වෙනසක් ද? කොතරම් අපූරු හැඟීමක් ද? ඔවුන් තුළින්ම ඇති වූ පරිවර්තනය මොන තරම් ද? ගැමියන් නව උද්යෝගයකින් පිබිදී සිටිනු දක්නට ලැබිණ. අස්වැන්න ද ඉතා සරු විය. ඔවුහු මුදලාලිලා සමඟ මිළ ගණන් පිළිබඳව වාද කොට තිරණයකට බැස ගත්හ. නිෂ්පාදන විකුණා ගැනීමේ විශ්වාසදායක නව මාර්ගයක් ඇති කර ගත්හ.

ඊළඟට යල සෘතුවේ දී ඔවුහු අලුත් ක්‍රියාවලියකට පිවිසියහ. එනම් ගමේ වැව් කණ්ඩියට පහළින් විශාල කෘෂිකාර්මික ළිං තැනීමයි. මේ අදහසත්, මීට සෑහෙන සහායකුත් ලැබුණේ පළාත් සභාවෙන් බව කිව යුතුය. පළාත් සභාව එක් ළිඳකට රු. 15000/= බැගින් ගෙවුව ද එක් ළිඳකට රු. 75000/=ක් පමණ වැය වන බව පෙනිණ. කෙසේ නමුත් එක් අයෙකු ළිඳක් කැපූ පසු, එහි ප්‍රයෝජනය දුටු, අනෙක් බොහෝ අය ද එසේ කිරීමට එක් වූහ. සාරගම් වැඩපිළිවෙළ යටතේ, ඔවුහු ශ්‍රමය වැය කොට නිම කොට, රු. 15000/= ක උපකරණ මිළ දී ගැනීමට යොදා ගත්හ. ගමේ කතාව වූයේ 45 ක් පමණ එබඳු ළිං පසුව සාර්ථක ලෙස නිම කළ බවයි. නාම්ණිකුලම දුප්පත් ගොවියෝ එම ළිං ඊළඟ කන්නයේ දී ප්‍රයෝජනයට ගැනීමට බලාපොරොත්තු වූහ.

මෙම ජයග්‍රහණ සමඟ නොයෙකුත් ප්‍රශ්න ද ඇති නොවුවා නොවේ. සහාය කණ්ඩායමට අයත් වූ නිසා ඇයට ද ඒවාට මුහුණපෑමට සිදුවීම වැළැක්විය නොහැකි විය. මේ අතර නොදැනුවත්කම, බලාපොරොත්තු කඩවීම, ආත්මහීනතාවය ආදි ඔවුන්ගේම ප්‍රශ්න ද තිබිණ. අවුරුදු ගණන් විදි පීඩනයෙන් උනන්දුව නැසී තිබිණ. මේ අතර කිහිප දෙනෙකු වෙනස්වීම්වලට ක්ෂණිකව භාජනයවීමට උත්සුක නොවූහ.

අනෙක් ප්‍රශ්න පැමිණියේ පිටතිනි. එයින් මූලික යයි කිව හැක්කේ ඔවුනට සහායවීමට සිටි නිලධාරින් තුළ පැවති උදාසීනත්වය හා දුරාවබෝධයයි. නිලධාරි සහාය දුප්පත් ජනතාවට අවශ්‍ය විය. උදාහරණයක් වශයෙන් ගතහොත් දුප්පත් පවුලකට බැංකුවකින් ණයක් ගැනීමේ දි නිලධාරි සහාය නොමැතිව එය කළ නොහැකි විය. එහි දි අභිමතාර්ථය දැක්වීම, පෝර්ම පිරවීම හා ඒවා නිර්දේශ කර ගැනීම ආදි නොයෙකුත් කටයුතු දුප්පත් ජනතාවටම කළ නොහැකි වූ නිසා එක්තරා

ප්‍රමාණයක පිටස්තර සහායක් ඔවුනට අවශ්‍ය විය. ඉදින් නිලධාරීන් එම කටයුතු නිසි අන්දමට ඉටු කරන්නට නම් ඔවුන් දුප්පත් ජනතාව අතරට පිවිසිය යුතුය. දුප්පත් ජනතාව සමඟ කතා බස් කළ යුතුය. ගැමියෝ හා ගමට අයත් වූ සහාය කණ්ඩායම එම කාර්‍යයන් ඉටු කර ගැනීමට ඉදිරියට බටහ. නමුත් එය සිතූ තරම් පහසු නොවී ය. එහි අතරමැද දී සලකා බැලීම පිණිස බොහෝ කරුණු පැන නැගිණ. එනිසා බොහෝ විට නියමිත ආධාර නොලැබිණ. නමුත් එය සාර්ථක වුණු අවස්ථාවලදී ප්‍රතිඵල ඉතා විශ්මයජනකවූ බව කිව යුතුය.

ඔවුනට ජනසවිය විසින් බැංකුවේ තැන්පත් කර දෙන ලද රු: 450/- පහසුවෙන් ප්‍රයෝජනයට ගත නොහැකි විය. බැංකුවකින් ණයක් ලබාගැනීම සැබැවින්ම ඔවුනට දුෂ්කර කාර්‍යයකි. බැංකු තවමත් ඔවුන්ගෙන් දුරස්ථය. වෙළෙඳ පොළද බොහෝ විට සිත්තැවුල් ඇති කරවන්නක් විය. සමුපකාර සිල්ලර ගබඩාවට ද සුළු සුළු ප්‍රශ්න තිබිණ. ජනසවිය යටතේ පළමුවෙන්ම නිෂ්පාදනය කොට එම නිෂ්පාදන විකිණීමට උත්සාහ කිරීමේ දී පැවති තත්ත්වය එයයි. දැන් මේ ප්‍රශ්න මදක් අඩුවී තිබේ.

මෙකී සියලුම අරගල හා කරදර මධ්‍යයේ වුව කරුණාවතිට සහ ඇගේ දරුවන්ට අමුත්තක් දැනිණි. පෙර කිසි කලෙකට වඩා ඔවුන් දැන් ශක්තිමත් යයි ඔවුනට සිතිණ. ඔවුනට දැන් සමාජයේ තැනක් තිබේ. අන් අය ද දැන් ඔවුන් ගණන් ගනිති. සමහරවිට ජනසවිය ආධාර ලබන අයෙක් දුප්පතුන්ගේ තත්ත්වය ද එසේ විය හැකිය. ඔව්, ඔවුහු දැන් ජනතාව අතර ගණන් ගන්නා කොටසක් වී සිටිති. ඔවුහු දැන් නිෂ්පාදනයට ද බැඳ සිටිති.

ඇයට ජනශක්ති බැංකුව අමතක කළ නොහැකිය. මුල දී නාම්ණිකුලම ගැමියන් තුළ වූයේ සිට්ටු ක්‍රමය පමණි. නමුත් වටරවුමේ යන එය ලබාගැනීමට බොහෝ කලක් ගතවන නිසා වඩා හොඳ ක්‍රමයක් ගැන සිතා බැලීමට ඔවුහු නිතැතින්ම පෙළඹුණහ. ඊට පසු ඔවුහු උනන්දුවෙන් වැඩ කරන නිලධාරී පිරිසක් හමුවී ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කළහ. ග්‍රාමීය බැංකුව ආදී බැංකු ගැන කියවා තිබූ එම නිලධාරීන්ට මෙහි දී සිතට නැගුණේ බැංකුවක් පිහිටුවීමේ අදහසයි. මේ කාර්‍යයෙහි ලා බොහෝ වෙහෙස වී වැඩ කරන්නට ඔවුන්ට සිදු විය. අනතුරුව උපදිසාපති කොට්ඨාශ තුළ සිටි ජනසවි ආධාර ලබන කාන්තාවන් සංවිධානය කොට කණ්ඩායම් වලට බෙදන ලදී.

1990 අගෝස්තු මාසයේ දී ජනශක්ති බැංකු පළමුවෙන්ම ආරම්භ විය. ගම් 20 කට එක බැගින් ජනශක්ති බැංකු 06 ආරම්භ විය. එය කරුණාවති වැනි කාන්තාවන් අරගල තුළින් ලබා ගත් ජයග්‍රහණයක් මෙන්ම ස්ථාවර තත්ත්වයක් ද විය. එහෙත් එය තාමත් මූලික අවශ්‍යතාවය නිසා එහි ප්‍රතිඵල ගැන කීම පසුවට තැබිය යුතු වේ.

කරුණාවතී සහ ඇගේ දූව සංවත්සරයේ වැදගත්කම ගැන සිතුවේ එපරිද්දෙනි. පසුව රෑ බෝවූ විට ජනසවිය දෙවන වටය ගැන සුප්‍රසිද්ධ නිවේදකයෙකු විසින් ගුවන් විදුලියෙන් පැවැත්වූ කතාවකට ඔවුහු සවන් දුන්හ. ජනසවිය දෙවන වටය අතිශයින් ශක්තිමත් කරනු ලැබූ එකක් බව ඔහු ප්‍රකාශ කළේය. පළමුවන වටයෙන් ඉගෙන ගත් බොහෝ පාඩම් ගැන සඳහන් කළේය. පහළට වැටී ඇති ජනතාවගේ සිතුම් පැතුම් අනුව පහළින්ම මතු වුණු ඒ පාඩම් ඉතා වැදගත් බව ඔහු අවධාරණය කළේය.

දුගී දුප්පත්කම තුරන් කිරීමේ මුළු වැඩපිළිවෙළම නැවත අධ්‍යයනය කොට සකස් කරන ලදි. දුප්පත් ජනතාව කොතන සිටියත්, ඔවුන් සොයා ගොස් ඔවුන්ට සහය වීම නව වැඩපිළිවෙළේ දර්ශනයකි. ඔවුන් භූමික සම්පත් ලෙසට ද යොමු කරනු ලැබේ. මෙහිලා අවශ්‍ය කටයුතු දැනටම සලසා ඇත.

නව වැඩපිළිවෙළ යටතේ පළමුවෙන්ම කරනු ලබන්නේ දුප්පත් ජනතාව යළි කොටස් 5 කට බෙදීමයි. එනම්, ජනසවිය ලබන ඉතා දුප්පත් කොටස, ආහාර මුද්දර ලබන ඉතා දුප්පත් කොටස, සාමාන්‍ය දුප්පත් කොටස, රැකියා බලාපොරොත්තු වන තරුණ කොටස සහ හරිහම්බ කිරීමට හැකි කමක් නොමැති මහළු හා ආබාධිත කොටසයි. සාමාන්‍ය දුප්පත් කොටස හා තරුණ කොටස මීට කලින් ගණන් නොගැනුණු අලුත් කොටස් දෙකකි. ජනසවි ආධාර හෝ ආහාර මුද්දර ආධාර නොතිබුණ ද ඔවුහු ද දුප්පත්ව සිටිති. එනිසා රැකියා සඳහා පුහුණු කිරීමෙන් රැකියා අවස්ථා ලබාදීමෙන් හා ණය ලබා දීමෙන් ඔවුනට ද සහය වීමට දැන් මාර්ග උදා කොට තිබේ. මෙය ජනසවියේ එක් අලුත් අංගයකි.

මෙහි දෙවැන්න වන්නේ මෙම ජන කොටස් සම්පත් සමඟ සම්බන්ධ කිරීමේ කාර්‍යයයි. සම්පත් උදාකර ගැනීම ජනසවිය සහාය වන අතර, ආධාර ද සපයා දෙනු ලැබේ. පුහුණු කිරීමේ මාර්ග, වැඩි දියුණු කිරීමේ මාර්ග තාක්ෂණික ආධාර හා ණය ආධාර වශයෙන් මේ කොටස් සතරකින් යුක්තය. මේ එක් එක් කොටස තුළ තවත් අතුරු ආධාර ක්‍රම ද අඩංගු බව කිව යුතුය. ඒ එක් එක් කොටසට අමාත්‍යාංශවලින් පෞද්ගලික අංශයෙන් හා සමුපකාර වලින් නන් විධ ආධාර ලැබෙන හෙයිනි.

දුප්පත් ජන කොටස් සම්පත් මාර්ග වලට සම්බන්ධ කිරීම අපහසු දෙයක් නොවේ. එයට කළ යුත්තේ ඉතා දුප්පත් කොටස් දෙකක් සාමාන්‍ය දුප්පත් කොටස හා තරුණ කොටසත් එක් පැත්තක තබා අනෙක් පැත්තෙහි ඒ එක් එක් කොටසට අවශ්‍ය සම්පත් මාර්ග තෝරා බේරා තැබීම පමණයි. සම්බන්ධ කිරීම මනා ලෙස ඉටුකිරීමට එය කදිම සැලැස්මක් වනු නියතය.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

මේ අන්දමට කටයුතු කළ හොත් අපගේ දුප්පත් ජනතාවට අපගේ නැගී එන දුප්පත් ජනතාවට සහාය වීම හා ආධාර කිරීම කළ හැකි වනු අතර, දැරිය හැකි වනු ද ඇත. දැනට තිබෙන ප්‍රශ්නය සම්පත් පමණක් නොවේ. වටිනාකම් යළි තක්සේරු කිරීම හා ක්‍රම සහ විධි යළි සකස් කිරීම ආදියෙහි ඊට වඩා කටයුතු තිබේ.

---

**කරුණාවතිලා ඔවුන්ගේ සිත් අරමුණක තබාගෙන සිටිති. අපිත් එසේම ද?**

---

# ගුණවතීගේ කතාව



ගුණවති කළ වැඩි දෙයක් කාටවත් පෙනුණේ නැති තරම්.

සෑම ගමනකින්ම ඇය ආපසු ගෙදරට සොයා ගෙන ආපු ලෑලි කෑලි, ලී, දර, ඉනි, පෙට්ටි එහෙම පිලේන්, වත්තේන්. තැන තැන තිබුණා. හිස් අතින් නම් ඇ එන්නේ නැහැ. ඇයි? ඒක මොකක්දෝ පුරුද්දක්. ඇගේ නැති බැරි කමින්ම උපන් පුරුද්දක්.

ළමයි හතර දෙනෙක් හදමින් ගුණවති ජීවත්වුණේ අතු පැලක. ඒත් ඔවුන්ට පොඩි වත්තක් තිබුණා. අක්කර කාලක විතර. ඒ බලයෙන් පදිංචි වුණ ඉඩමයි. දහසක් දෙනා මෙන්. බාලම දරුවාට වයස අවුරුදු දෙකයි. අනිත් තුන් දෙනාම ඉස්කෝලෙ යනවා. කුලියෙන් මිස වෙන කොහොම ද ඇ ඔවුන් ජීවත් කරවන්නෙ? දරුවන් බඩගින්නෙ ඉන්න දවස්වලයි

ගුණවතිගේ ඇතුල් හද වේදනාවෙන් කිරි ගහෙන්නෙ.ඒ වෙලාවල ඔවුන්ට දෙවෙන්නෙ පාන් කැල්ලක හෝ විස්කෝතුවක් එක්ක කහට ටිකක් විතරයි. ඒත් ඇ ඉන් කම්පා වෙන්නේ නැහැ, පසුබහින්නෙ නැහැ. ඇගේ අධිෂ්ඨානය තව එඩිතර වෙනවා පමණයි. වෙනදටත් වඩා දැඩි ඕනෑකමකින් ඇ කුලී වැඩ හොයාගෙන යනවා. රෑටත් අමතරව කුඩයක් හෝ පැදුරක් වියා මුදල් කරන්න හදනවා. මිරිස්, දඹල, බටු, මෑ, කව්පි, පාත්ති කිපයක් හිටවනවා. ඒ උත්සාහයට නිමක් නැහැ. නින්දට යන තෙක් ඇගේ දෑත, දෙපය, මොකක හරි යෙදිලා.

සෑම පෝය දවසකම ගුණවතී බෝධිය ළඟට ළමයි කැටුව යනවා. ගිහින් පින් දෙනවා. ඇ කිසිවක් දෙවි දේවතාවුන්ගෙන් ඉල්ලන්නේ නැහැ. ඇ තුළ නිමක් නැතුව උදවුණු අධිෂ්ඨානයට, උත්සාහයට, බලාපොරොත්තුවලට ඇ පිං දුන්නා. මොකක්දෝ ගයියක් ඇ තුළ තිබුණා. ඇගේ දුප්පත්කමෙන් මිස, කොහෙන් උපන් ශක්තියක් ද කියලා ඇ දන්නේ නැහැ.

ඒත් රැළග වැස්සට මත්තෙන් බොහෝ වෙනස් වුණා. ගම්මු එකතු වෙලා, ඇට අනුකම්පා කරලා, නිවාස දස ලක්ෂයේ ප්‍රංව් ණයක් ඇට අරන් දුන්නා. ගුණවතිගේ ගේ වැඩ කිරීමට ඔවුන් උදව් කළා. ස්ථිර උළු වහළකුයි. වටපිලකුයි, කපලාරෑ කළ බිත්තියි අලුතෙන් බැඳලුණා. අලුත් වැසිකිලියකුත් හැදුණා. වාසනාවක මහත.

ගම්මු ගේ හදල දුන්නයි කියන එක, එක අතකින් වැරදියි. ගුණවතියි ළමයි තුන් දෙනයි හරි හරියට වැඩ කළා. මෝඩ ගල් කැපුවා, ඇද්දා. ඇලෙන් වැලි ඇද්දා. ඔක්කොම අත් වැඩ දුන්නා. බාස්උන්නැහැලාට. මේ පරිවර්තනය ඇ කවදාවත් බලාපොරොත්තු නොවුණු භාග්‍යයක්.

ඒ වෙනුවෙන් ඇ පන්සලට ගිහින් දනයක් දුන්නා. එද ඇ මුළු ගමටම පිං දුන්නා.

නගරයෙන් ගමෙත් සංවර්ධන වැඩවල යෙදිල ඉන්න අපට, ගුණවතිලා අනන්ත අප්‍රමාණව මුණ ගැහෙනව. ඔවුනගෙ මනුස්සයින්, ළමයින් සහ වෙනත් නෑදෑ මිත්‍රාදින් ද සමහ.

බොහෝ කලකට අපි සංවර්ධන වැඩ කළ විදිහට නොවෙයි දැන් අපි ඒ වැඩ කරන්නෙ. ඒ වෙනසට මුල් වුයේ ගුණවති වගේ අය. ඔවුන් අපට පාඩම් උගන්වන කාලයයි මේ. ඔවුන්ගෙන් අපි පාඩම් ඉගෙන ගැනීමට කැමැත්තෙන් සිටින කාලයක් අද.

**1. මානව සම්පත මූලික සම්පතයි.**

සාමාන්‍යයෙන් ගුණවතිලා අපේ උගත්කමට හසු වෙන්නේ නැහැ. අපි ඔවුන්ට පහසු ලේබලයක් අලවනවා, දුප්පතුන් කියල.

දුප්පතුන් පිළිබඳ සාමාන්‍ය මතය තුළ ඇත්තේ කාලකන්නිකම, මෝඩකම, දරදඬුකම, අපරාධය, වැනි ගුණයක්. ගුණවතිලාට වටිනාකමක් දෙන්න අප අපොහොසත් වෙනවා. ඇගේ අධිෂ්ඨානය, උනන්දුව, මහන්සිය අපට පෙනෙන්නේ නැහැ. ඇගේ පුංචි උත්සාහයන් - වැට හැදිම, වතුර ඇදිම, එළවලු වැවීම - නොවටිනා සාමාන්‍ය දේවල්.

ඒත් ගුණවතිලා සමඟ ගෙවල් හැදිමෙන් අපට පුළුවන් වුණා ඔවුන් දිහා අලුත් ඇසකින් බලන්න. ඔවුන් නියෝජනය කළේ පුදුම බලවේගයක්. අපූරු නිර්මාණාත්මකභාවයක්. ප්‍රබල මිනිස්කමක්. සියලු සම්පත් අහිමිවා ඔවුන්ගේ මිනිස්කම ඉස්මතුව පෙනුණා.

සංවර්ධනයේ කේන්ද්‍රීය සාධකය මනුෂ්‍යයායි. දැඩි අවශ්‍යතා ඇති දුප්පත් මිනිස්සු. සල්ලි, යන්ත්‍ර සූත්‍ර, විදේශාධාර, තාක්ෂණ දැනුම යනාදිය අවශ්‍ය වෙන්නේ දෙවෙනුවයි.

ගුණවතිලා කරන මුල පිරිම් බොහෝ ය. ඒවා අඳුනාගෙන සහායවීමයි, ඔවුන් අපෙන් බලාපොරොත්තු වෙන්නේ:

**2. දුප්පතුන්ගේ පොහොසත්කම:**

ගුණවතිලාගේ අවංකකම, අදිෂ්ඨානය, වැරවෑයම කියන්නේ කොපමණ වටිනා වස්තු ද? ඒත් දුප්පතුන් පිළිබඳ සම්මත මතය නිසා මේ සියල්ල වැසී පවතිනවා.

ගුණවතිලා පිවත් කරවන්න නම්, අපි මේ පොහොසත්කම වැඩි වැඩියෙන් දකින්න ඕනෑ. ඇගේ අවංකකම මාහැඟි වත්කමක් සේ අපි පිළිගත යුතුයි. ඒ හමුවේ අපි ඇගෙන් ඇප ඉල්ලිය යුතු නැහැ. එය උතුම්ම ඇපයක්.

අනවසරයෙන් පදිංචිවීම, අතුපැලක් හදා ගැනිම, එළවළු පාත්ති හා වැට හැදිම, කුලී වැඩට යෑම - මේ සියල්ල කොයිතරම් වීරෝදාර ද? මේ උත්සාහය අදිෂ්ඨානය සුළුපටු පොහොසත්කමක් ද? මේවාට වටිනාකමක් නො දෙනවයි කියන්නේ, ගුණවතිලාගේ උරුමය සම්පූර්ණයෙන්ම යටපත් කරල, කොන්ත්‍රාත්කරුවන්, සල්ලි, යන්ත්‍රසූත්‍ර, කෙරෙහි විශ්වාසය තිබීමයි.

සංවර්ධන කටයුතු වලදි දුප්පතුන් ඒ ආකාරයෙන්ම විශ්වාසයට ගත යුතුයි. මෙවැනි විශ්වාසයක් නැතුව, ඔවුන් සමඟ ගවුලෙ වැඩ කරන්න බැහැ. විශ්වාසය උපදිනවා.

**3. පරිමාණ ප්‍රශ්නයට අපූරු පිළිතුරක්.**

මෙතෙක් කල් අපට ග්‍රහණය කරගන්න බැරිවුණු පරිමාණය පිළිබඳව ගැටලුවටත්, ගුණවති පාඩමක් ඉගැන්නුවා. සංවර්ධනයේ නියමුවන් බහුජනතාව කළ විට, සංවර්ධනය සඵලවත් වෙනවා

එගේම ව්‍යාප්ත වෙනවා. දුප්පතුන් දුප්පතුන්ගේම සංවර්ධනයක් බවට පත් වෙනවා. අපෙන් කළ යුත්තේ ඔවුන්ට සහායවීම පමණයි. ප්‍රධාන වගකීම ඔවුන් තුළයි. ප්‍රශ්නය තුළ ඉන්න අයයි ඊට විසඳුමක් සොයන්නෙ. ප්‍රශ්නෙයි විසඳුමයි දෙකම ඇත්තේ එකම තැනයි.

මේ ක්‍රමය උපයෝගි කරගැනීමෙන් තමයි අපි නිවාස දසලක්ෂය යටතේ ජයපිට ජය නෙළා ගන්නේ. 1984 ග්‍රාමීය වැඩසටහනෙන් අපි පවුල් 43213 කට උදව් කළා. 1985 අපි පවුල් 42077 කට ආධාර කළා. මේ වැඩ පිළිවෙළ රටේ සෑම ගමක්ම පාසා වගේ පැතිරිලා හමාරයි.

ගුණවතිලා මත විශ්වාසය තැබීමෙන් අපි පරිමාණය පිළිබඳ ප්‍රශ්නය විසඳුවානේද?

4. සතුට නෙළන අඩු වියදම් විසඳුම්

මේ දර්ශනය අනුව විසඳුම්වලට වැය වන්නේ ඉතා සුළු මුදලක්ය. ග්‍රාමීය නිවාසයක් සඳහා අපට වැය වන සාමාන්‍යය රු. 4500/- ක් විතර වෙනවා. මෙපමණ මුදලින් ඉදි වෙන ආයෝජනය, ඊට තුන් හෝ හතර ගුණයක් වටිනවා. ඉතුරු වටිනාකම සියල්ලකම එකතු වන්නේ ගුණවතිලාගේ ශ්‍රමයෙන්. අපෙන් දෙන මුදලෙන් හොරෙන්නේ ඔවුන්ගේ අධිෂ්ඨානය සනාථ කිරීම හා වෙළෙඳ පොළෙන් ගත යුතුම බඩු - උළු, හුණු, සමහරවිට දැව සිමෙන්ති, කොට්ටයක් දෙකක් විකා ගැනීම පමණයි. ඒත් අඩු වියදම් වුණාට නිමාව, තත්ත්වය, අලංකාරය, හා සතුට වැඩියි. තමන්ම කරන, තමන්ම කරවන, තමන්ම වගකියන, රජය සහාය වෙන වැඩය, යටත්විජිත යුගයේ සිට අද දක්වා අපට පුරුදු පුහුණු වෙච්ච පුරුද්ද මුළුමනින්ම පිටු දැකීමක්.

මේ අත්දැකීමෙන් අපි නිහතමානිකමේ මහිමය තේරුම් ගත්තා. නිහතමානිකම නැති දවසෙ තමයි, අපට මේ ප්‍රංචි ජයග්‍රහණ නොපෙණුනේ.

සංවර්ධනයේ මාවත පිළිබඳව දැන් අපේ ඇස් ඇරිලා.

අපි ගුණවතිට සහ ඇගෙන් ලත් සමාජ අධ්‍යාපනයට සඳ ණය ගැතියි.

# කොහොලංගල වයලට් නාලනී ගේ කතාව

**(1990 නොවැම්බර් 17 ද බුන්දල ජනහමුවේ දී අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ ආරාධනය උඩ කළ කතාවේ පිටපතයි)**


මම අත්දැකීම් ලබපු හැටියට ජනසවිය යනු, නැති බැරි අය ඇති හැකි අය කිරීම යි. තාමත් මා හිතන්නේ නැති බැරිකමින්ම පීඩිත වෙන පන්තියක් ඉන්නවා. ඒ සමහර අය ජනසවිය කියන්නේ මොකක්ද කියලා දන්නේ නැහැ. ජනසවිය යි කියන්නේ, හැමදම ලොකු මිනිස්සු ගාව වැඩ කරන එක නෙමෙයි. ජනසවිය කියන්නේ අපේ ශක්තිය.

අපට බැරිද, උදැල්ලක් ගත්තොත් පොළොව කොටන්න. අපිට පැලයක් හිටුවන්න පුලුවන්. අපේ අතින් හිටෙව්වම ඒ පැලය ලොකු වෙන්නේ නැද්ද? ඒ පැලය ලොකු වෙනවා. ඒකෙන් සාර්ථකත්වයක් ලබන්න පුලුවන්. ජනසවිය කියන්නෙ අන්න ඒක. අපට ජනසවියෙන් උගන්නල තියෙන්නෙ, නායකත්වය කියන්නෙ තමන්ගෙ හැකියාව. මිනිස්සු අත - පය හකුළගෙන, වකුටුකර ගෙන සිටි අර පෙර යුගය දැන් අතහැර දල ඉදිරියට යන කාලයක් තියෙන්නේ. අපේ අතිගරු උතුමාණන් තීක්ෂණ ඥනයෙන් කරපු ජනසවියේ හැටි බලන්න.

මේ වතුර ටැංකිය කවදාවත් අපට එනව ද, මේ උතුමාණන් ගෙ අදහස නැත්නම්. අපිකවදත් බොන්නෙ ළිං වතුර. කවදත් බොන්නෙ වැව් වතුර. වතුර උණු කරල බොන්න පුරුදු වුණේ නැහැ. ඇයි අපි දන්නෙ නැහැ.

මෙච්චර කල් දුප්පත් මිනිස්සු කොන්කරා. ජනසවිය නිසා දුප්පත් මිනිහ ඉදිරියට ආවා. මං අහිංසක පවුලක දුප්පත් කාන්තාවක්. බලන්න අද ජනාධිපතිතුමාණන් ළඟ මං කථාවක් පවත්වනවා.

කොහොලංගල ග්‍රාමසේවා නිලධාරි මහතා සහ අපේ උපදිසා



පතිතුමාගේ අනුදැනුම ඇතුව, අප ගොවිපලක් ආරම්භ කරල තියෙනවා. ගොවියො විසිපස්දෙනයි. අපි එක දවසට කම්බි කොට 1250 ක් කැපුවා. ජනසවියෙයි කියන්නෙ ස්වශක්තිය නගා සිටුවීම, සමගිය යන මේ පරමාර්ථ දෙකයි.

පැරණි මතිමතාන්තර සේරම කඩා ගෙන යනව ජනසවිය කියන අකුරු පහ නිසා. ජනසවිය ආරම්භයත් එක්කම පුදුම සමගියක් අපේ ගමේ තියෙනවා. බලන්න ජනසවිය නිසා එකමුතුකම.

ජනසවියෙයි කියන්නේ මිනිස්සුන්ගෙ නැති බැරිකම නැති කිරීම පමණක් නෙමෙයි. බලන්න සමගිය, සමගිදනය, එකතුවෙලා වැඩකිරීම, එක් කෙනෙක් පිට පැවරෙන එක දහ දෙනෙක් එකතු වෙලා කිරීම. පාලමක් හදනව නම්, යන්ත්‍ර ගෙනල්ල හදන්න ඕනෙ නැහැ. අපේ ශ්‍රමය තියෙනවා. උදැල්ලක් ගහලා පස් පිඩැල්ලක් කපල බලන්න. ඒ එක පස් පිඩැල්ලෙන් තව දවස් ගානක් කැපුවොත් පස් කණ්ඩිය වැවක කණ්ඩියක් බැදෙනවා. එතකොට යන්ත්‍ර ඕනෙ නැහැ. අපිට මන්ත්‍රීතුමට ලියන්න ඕනේ නැහැ. අපි හොද නම් ඕනම දෙයක් කරන්න පුලුවන්. ජනසවියත් එක්ක අපේ ශක්තිය නගා සිටුවන හැටි තමුන්නාන් සේලාට දැන් තේරෙනවා ඇති.

ඕනම වෙලාවක එන්න. කොහොලංගල ජනසවි ගොවිපල කියල පාර අයිනෙ කහපාට බෝඩ් එකක් ගහල ඇති. ඒ ගොවිපල ඇතුලේ කුකුල් ව්‍යාපෘතිය කරපු හය දෙනෙක් ඉන්නවා. ජනසවිය ස්වයං රැකියා ආරම්භ කරනවා. බයිසිකල්, සාප්පු, මැහුම් ගෙතුම් පුහුණුවලට යවනවා. බලන්න කොයිතරම් වැඩ රාශියක් කරනව ද? ජනසවිය කියන්නෙ අන්න ඒක මහත්වරුනි. තෙලුල ගම්මානය, සිරියාගම ගම්මානය කොයි තරම් දියුණුවක් ලබල තියෙනව ද. මෙතන බුන්දල ගන්දියෙන් හැරුණ තැන ඉදල පහුගිය කාලෙ පාලම් කැඩිල ගිහිල්ලා තිබුණා. බලන්න අද වෙන කොට පාලම් හැදිලා තියෙනවා. කාගෙන්ද නැහැ. යන්ත්‍රසූත්‍රවලින් ද? නෑ. තමන්ගෙ ශ්‍රමයෙන්.

අන්දරේ කියල තියෙනවා පැරණි කියමනක්. අන්දරේ කියල තියෙනවා, කොයිදේටත් හොඳදේට බඩ කොයිවෙලාවෙත් ඉඩ තියෙනවායි කියල. කොච්චර අහස උසට බත් කෑවත්, කිරි ඩිංග ඇතුල් කරන්න ඉඩ තියෙනවයි කියල. අන්න බලන්න හොඳ වැඩ කළොත් මොන දේටවත් අපි බය නැහැ. නිර්භීතව, එඩිතරව ඉදිරියට එන්න ඕන.

ජනසවියෙයි කියල අපේ උතුමාණන් පෙන්නුවෙ අන්න ඒක. අපි හිටපු තත්ත්වෙ මොකක්ද කියල බලන්න. ඕගොල්ලන්ට පුංචි ගම්මානයක් හදන්න බැරිද? අපි විසිපස් දෙනෙක් එකතුවෙලා ලස්සන ගම්මානයක් හැදුවා.

අද ගිහිල්ල බලන්න, එක ඉඩමක හැත්තෑ පහක් තියෙනවා, කජු පැල. ලස්සන කජු පැල. පහුගිය කාලේ ඉඩෝරය ආව. අවුරුදු තුනක්. ඒත් අපි අතහැරියෙ නැහැ. ඒ අවුරුදු තුන ඇතුළත කජු පැල ටික ආරක්ෂා කර ගෙන. අපේ කෑම - බීම වේල අතහැරල, ජනසවි වැඩවලට අනිවාර්යයෙන් ගිහිල්ලා, අපේ කජු පැලය ආරක්ෂා කර ගත්තා. අපේ ජීවිතේ වගේ තමයි, කජුපැලෙත් කියලා හිතාගෙන, විසිපස් දෙනාම එහෙම එකතු වෙලා ඒ අදහසින් වැඩ කළා. බැරිද ඕගොල්ලන්ටත් ඔය වගේ ගොවිපලවල් ආරම්භ කරන්න. බැරිද ඒ වගේ සමගියෙන් ඉන්න. ඕගොල්ලන්ටත් පුලුවන්. මහත්වරුනි හිතුවොත් කරන්න බැරි දෙයක් නැහැ. අපේ සිංහලයො කියනවනෙ, අපේ සිංහල මිනිස්සුනට පුදුම හැකියාවක් තියෙනවා කියලා. ඒ හැකියාව දැන් මතුවෙලා. පහුගිය යුගයේ ජනසවිය එන්න ඉස්සෙල්ලා, එහෙම ඕගොල්ලන්ට කථාකරන්නවත් හැකියාවක් තිබුණේ නැහැ. ගොන්නෝරුවේ ගිරිඅරමේ කිව්වොත්, බුන්දල කිව්වත්, නිලධාරි අඳුරන්නෙ නැති පිරිසක් තමයි, හිටියෙ. දැන් බලන්න කීදෙනෙක් ඕගොල්ලන්ට ඕගොල්ලන්ගෙ හාද සාක්ෂිය අනුව, තමන්ට - තමන් අවංක වෙලා බලන්න. අපේ ග්‍රාමසේවක රාළහාමි ළඟට අද කොයිතරම් කිට්ටුවෙන්න පුළුවන්ද කියල. ජනසවියත් එක්ක තමයි, ඕගොල්ලො නිලධාරි අඳුන ගත්තෙ.

පොලිසියෙ ලොකු මහත්තයෙක් වුනත් අදුරගත්තෙ ජනසවිය නිසා.

දැන් තමාගේ ස්ව ශක්තියෙන් නැගි සිටින්න ඕනා. තමන් ස්වයං රැකියාවක් ආරම්භ කරන්න ඕනා. මහන්න පුරුදු කරන්න යවනවා. ගොතන්න පුරුදු කරන්න යවනවා. වේවැල් භාණ්ඩ වැඩවලට යවනවා. විදුලි ඉංජිනේරු වැඩවලට යවනවා. බුයිවර් පුහුණුවට යවනවා. ඕවට පුහුණුවෙලා ආවම තමන්ට ස්වශක්තියක් තියෙන්න ඕනා මං මේ පුහුණුවෙලා ආ එකෙන් මම සමාජයට වැඩක් කරනවයි කියලා. කොච්චර හදන්න බැරි වුනත් හදන්න පුලුවන්. ආදරයෙන්, කරුණාවෙන් කථා කළොත්. බල්ල මෙහාට වරෙන් කිව්වොත් එන්නේ නැහැ. එන්න කියලා කථා කළොත් නිරිසනාට වුනත් හොඳින් කියන්න. ගොනා යමන් කිව්වට යන්නේ නැහැ. යමන් පුතා, යමන් කියන්න ඕනා. එහෙම තමයි හරියන්නෙ. මිනිස්සු හදන්න ඕනා එහෙමයි. එදා දහ දෙනෙක් වැඩ කරපු කොහොලංගල එත්නෙ. අද තිස් තුන් දෙනෙක්. තිස්තුන් දෙනාම දැන්වලින් වැඩ කරනවා. එන්නෙ නැත්නෙ උණ හැදුනොත් පමණයි. ලෙඩෙක් වුණොත් පමණයි. මරණයක් වුනොත් පමණයි. මඟුලක් වුණත් අපිට ලියුමක් දෙන්න ඕනා.

ස්වයං රැකියා ආරම්භ කරන්න. එක්කෝ මිරිස් පැල දහයක් දන්න. ඒ දහය හොඳට වවා ගන්න. ඒකෙන් ලැබෙන ආදයම පොතට මුට්ටක් දන්න. රුපියල් විසිපහක්, තිහක්. ඒකට පොලි වුණාම තමන්ගෙ සල්ලි. තමන්ගෙ රජයෙ තියෙන්නෙ තමන්ගෙ සල්ලි. ඒවයින් බලන්න අපිට ස්වයං රැකියා ආරම්භ කරන්න පුළුවන්.

අද බලන්න අපේ කොහොලංගල ගමේ පාන් බේකරියක් දැම්මා. අපේ දිසාපතිතුමා ආපු වෙලාවෙ මෙහෙම අදහසක් තියෙනවා කියලා දිසාපතිතුමාට කිව්වා. ඒ වෙලාවෙ බලන්න දිසාපතිතුමා ඇවිල්ලා එවෙලෙම ලිව්වා, ලංකා බැංකුවට රුපියල් දහ දහක් දෙන්න මෙයාගෙ පාන් බේකරිය දියුණු කරන්න. බලන්න කට වවනෙ විතරයි.

තමන්ගෙ ස්වයං රැකියාව මොකක් ද? කල්පනාවෙන් තමන් ගත්ත සල්ලිවලින් ණය අරගෙන ඇති පිරිස දැන් ජනසවියෙන් ණය දි ඇති. ඒ ණයවලින් කරේ මොකක් ද? ණයවලින් කරන්න ඕන මොකක් ද? මාසෙකට ගෙවන පොලිය කිය ද? ඒව හැම දෙයක්ම කල්පනා කරන්න ඕනා. එක මාසෙක රුපියල් සීය ගෙව්වෙ නැත්නම්, දෙවෙනි මාසෙට දෙසීයක් ගෙවන්න වෙනවා. එහෙම කරන්න එපා. එතකොට තමයි, තමන්ට දියුණු වෙන්න ඇහැක්කෙ.

එක්කෙනෙක් මූලික වෙලා පවුලේ නඩත්තු කරන හොඳම ජනසවිය, ජනසවිලාභී පවුල් කොට්ඨාශයක් කියලා. ඩිරියාගම උපන් මිනිස්සු හොඳ ජනසවි පවුල් කොට්ඨාශයක් කියල මං විශ්වාස කරනවා. මා අන්තිම වරට කියනවා අතිගරු උතුමාණනි, අපේ ගොවිපලේ තිබුණු සාර්ථකත්වය මේ ගම්මානයෙන් මතු වේවා කියලා. අම්මලා, තාත්තලා, අක්කලා, අයියලා, ජනසවියෙන් ලැබෙන ස්වශක්තිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින්. අපට තියෙන ධෛර්යය මෙන්න මගේ ධෛර්ය ඔබලාට පුදවේවා කියමින් නවතිමි.

* * *

[illegible]

ජනසවිය
சன சக்தி
JANA SAVIYA

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය

# ජනසවිය කොමසාරිස් දෙපාර්තමේන්තුව

අංක 17,
බාර්න්ස් පෙදෙස,
කොළඹ 07.

සායන විසංගත හැම මග හැරියන්
මහට ම වගේ යළුවත් වැව් පිරීයන්
හැම දියුණුවම පිළිබඳ කිරි'තිරීයන්
වන්නිය වෙනස් වුණු දා මා මැරීයන්..

-විමලරත්න කුමාරගම "විනාසිතය."

මිල රු. 5.00

තරුණ සේවා මුද්‍රණාලය